# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/30 - 2019 ජනවාරි මස 23 වැනි බදාදා - 2019.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ බණ්ඩාරවෙල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

නියෝජ්‍ය නගරාධිපති, නගරාධිපති ධූරයට පත්වීම හේතුකොට ගෙන බණ්ඩාරවෙල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ නියෝජ්‍ය නගරාධිපති වන ජනක නිශාන්ත රත්නායක අයත් වන්නා වූ අංක 1 දරන ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම බණ්ඩාරවෙල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී අංක 1 දරන ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා හීන්කෙන්ද මුදියන්සේලාගේ මිත්‍රපාල හීන්කෙන්ද නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

බණ්ඩාරවෙල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් හීන්කෙන්ද මුදියන්සේලාගේ මිත්‍රපාල හීන්කෙන්ද, බණ්ඩාරවෙල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,  
තේරීම්භාර නිලධාරී,  
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2019 ජනවාරි මස 23 වැනි දින,  
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,  
බදුල්ල දිස්ත්‍රික්කය.

02 - 275

1A - G 29307 — 27 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*